IHRA
UNIVERSITY OF COLOMBO

## මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2016/2017

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2019 ජූනි)

# BLE 309 - ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති හා සංවර්ධනය

අයදුම්කරුවන්ට උපදෙස් :

(1) ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුය.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු හතරකින් (04) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01.

i. රටක ආර්ථික වර්ධනය තීරණය කරන ප්‍රධාන සාධක පහක් (05) නම් කරන්න.

(ලකුණු 05)

II. පසුගිය වසර හතර තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගයේ පසුබෑමක් ඇතිවීමට බලපෑ ප්‍රධාන සාධක පහක් (05) කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

III. ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය ඉහල දැමීම සඳහා ඔබ ඉදිරිපත් කරන යෝජනා පහක් (05) කෙටියෙන් පහදන්න.

(ලකුණු 05)

IV. ශ්‍රී ලංකාවේ ආදායම් ව්‍යාප්තියේ මෑතකාලීන උපනතීන් හඳුනාගෙන ඒවාට බලපෑ සාධක කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

02.

i. රටක ආර්ථික පසුබෑමක් සහ අර්බුදයක් අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. 2019 අප්‍රේල් මාසයේදී සිදුවූ ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් මෙරට සංචාරක කර්මාන්තයට ඇතිකල බලපෑම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපරය දියුණු කිරීම සඳහා වැදගත්වන යෝජනා පහක් (05) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iv. ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය වේගවත් කිරීම උදෙසා ශ්‍රම වෙළඳපොල ප්‍රතිව්‍යුහගත කරණය සිදුකල යුතු ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

03.

i. රටක ආර්ථික වර්ධනය, සංවර්ධනය සහ තිරසාර සංවර්ධනය අතර පවත්නා සම්බන්ධතා පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. 2030 වර්ෂයේදී තිරසාර සංවර්ධන පරමාර්ථ වලට ළඟාවීම සඳහා ශ්‍රී ලංකාව අනුගමනය කලයුතු පියවර පහක් (05) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. ඵලාදායී අධ්‍යාපනය, ව්‍යවසායකත්ව සංවර්ධනය, ශ්‍රම සංක්‍රමණය අතර පවත්නා සම්බන්ධතා කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iv. දෙපරතර (Twin Deficits) ආකෘතිය ඇසුරෙන් වර්තමාන ශ්‍රී ලංකා ආර්ථිකයේ ස්වරූපය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

04.

i. වර්තමාන ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන ලක්ෂණ පහක් (05) පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා රටක මධ්‍යම බැංකුව විසින් භාවිතා කරන උපකරණ පහක් (05) නම් කරන්න. ශ්‍රී ලංකා මහ බැංකුව අනුගමනය කරන මූල්‍ය ප්‍රතිපත්තියේ මෑතකාලීන උපනතීන් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. සැපයුම් අංශයේ ආර්ථික ප්‍රතිපත්ති යනු මොනවාද? ශ්‍රී ලංකාවේ දැනට භාවිතවන එවැනි ප්‍රතිපත්ති පහක් (05) නම් කරන්න.

(ලකුණු 05)

iv. ශ්‍රී ලංකාවේ දිළින්දන්ගේ ප්‍රධාන ලක්ෂණ පහක් (05) නම්කොට මෙට දිළිදුකම අඩුකිරීම සඳහා භාවිතා කලහැකි සැපයුම් අංශයේ ප්‍රතිපත්ති තුනක් (03) නම් කරන්න.

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

05.

i. රටක උද්ධමනයක් ඇතිවීමට හේතුවන ප්‍රධාන කරුණු මොනවාද?

(ලකුණු 06)

ii. ශ්‍රී ලංකාව ආශ්‍රයෙන් එම ප්‍රධාන කරුණු විග්‍රහ කරන්න.

(ලකුණු 07)

iii. උද්ධමනය ඇතිවූ විට සිදුවන අවාසිදායක තත්වයන් ශ්‍රී ලංකාව ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 07)
(මුළු ලකුණු 20)

06.

i. ශ්‍රී ලංකාව වැනි රටකට විදේශ ආයෝජන ලබාගැනීමට හේතුවන කරුණු වර්තමාන ආර්ථික තත්වයන් ඇසුරෙන් විග්‍රහ කරන්න.

(ලකුණු 07)

ii. විදේශ රටවල් ලබාදෙන නිල සංවර්ධන ආධාර ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය වැඩිකිරීම සඳහා යොදාගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 06)

iii. විදේශගත ශ්‍රී ලාංකිකයන් මෙරටට එවන ආමුඛ ප්‍රේෂණ (Remittances) ප්‍රමාණය වැඩිකරගැනීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග මොනවාද?

(ලකුණු 07)
(මුළු ලකුණු 20)

******

07.

i. රටක විදේශ විනිමයේ ඉල්ලුමට සහ සැපයුමට බලපාන සාධක මොනවාද,

(ලකුණු 06)

ii. රටක් පාවෙන විනිමය අනුපාතික ක්‍රමය අනුගමනය නොකිරීමෙන් ඇතිවිය හැකි වාසි සහ අවාසි මොනවාද?

(ලකුණු 07)

iii. ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට හිතකර වන විදේශ විනිමය අනුපාතික ක්‍රමයක් යෝජනා කොට එහි වාසි අවාසි පෙන්වා දෙන්න.

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

08.

i. ඉතිරිකිරීම් සම්බන්ධයෙන් ජොන් මෙනාඩ් කේන්ස් විසින් ඉදිරිපත් කරන ලද කරුණු ලංකාවට කෙසේ අදාල වේද?

(ලකුණු 05)

ii. ඉතුරුම්, ආයෝජන සහ ආර්ථික වර්ධනය අතර පවතින සම්බන්ධතා හැරඩ් ඩෝමාගේ ආකෘතිය ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. "ශ්‍රී ලංකාවේ විදේශ ඉතුරුම් වර්ධනය කරගැනීම සඳහා අපනයන ව්‍යුහය විවධාංගකරණය කලයුතු අතර ආනයන ව්‍යුහය ඒකාංග කල යුතුය." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iv. මෙරට ගෙවුම් ශේෂය ශක්තිමත් කිරීම සහ විදේශ ණය බර අඩුකිරීම සඳහා ඔබ ඉදිරිපත් කරන ප්‍රධාන යෝජනා පහ (05) මොනවාද?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

*******